සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2026 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2026-02-08
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, “කළමනාකරණය” යන්න වඩාත් හොඳින් නිර්වචනය කරන්නේ කුමකින් ද?

(1) පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීම සඳහා යටත් සේවකයින්ට සියලු වගකීම් පැවරීමේ ක්‍රියාවලියයි.

(2) සංවිධානයක අරමුණු සහ පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා කාර්යක්ෂමව සහ සඵලදායී ලෙස පුද්ගලයින් හරහා වැඩ කරවා කරගැනීමේ කලාව වේ.

(3) එදිනෙදා මෙහෙයුම් නොසලකා හරිමින්, සංවිධානයේ දිගුකාලීන අරමුණු සැලසුම් කිරීමේ ක්‍රියාව වේ.

(4) සංවිධානයේ අරමුණු කෙරෙහි අවධානය යොමු නොකර සේවකයින් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියයි.

**1.2** අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේදී, අවම සම්පත් ප්‍රමාණයක් භාවිතයෙන් උපරිම නිමැවුමක් ලබාගැනීම:

(1) කාර්යක්ෂමතාවය වේ.
(2) ඵලදායීතාවය වේ.
(3) සඵලදායීතාවය වේ.
(4) නායකත්වය වේ.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් අතිරික්තය සඳහා උපාය මාර්ගයක් **නොවන්නේ** කුමක් ද?

(1) නැවැත්වීම (Lay off).
(2) සේවය අවසන් කිරීම.
(3) උප කොන්ත්‍රාත් ලබා දීම.
(4) විශ්‍රාම යැවීම.

**1.4** ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි කෘත්‍රිම බුද්ධිය [Artificial Intelligence (AI)] සහ යන්ත්‍ර ඉගෙනීමෙහි [Machine Learning (ML)] බලපෑම වඩාත් හොඳින් විස්තර කෙරෙන්නේ පහත සඳහන් ඒවා අතුරෙන්, කුමකින් ද?

(1) ඒවා සෑම කර්මාන්තයකම සිටින සියළුම මානව සේවකයින් (human workers) ආදේශ කෙරේ.

(2) එමඟින් කර්මාන්තවල ක්‍රියාවලි ප්‍රශස්ත කිරීමට, යෙදවුම් ද්‍රව්‍යවල භාවිතය අඩු කිරීමට සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට ඉඩ සලසයි.

(3) ඒවා මඟින් සැලසුම් කිරීම සහ පාලනය වැනි කළමනාකරණ කාර්යයන් සඳහා ඇති අවශ්‍යතාවය ඉවත් කරයි.

(4) ඒවා විනෝදාස්වාදය සහ සමාජ මධ්‍ය යෙදුම් සඳහා මෙවලම් ලෙස පමණක් ක්‍රියා කරයි.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, සමස්ත තත්ත්ව කළමනාකරණයේ [Total Quality Management (TQM)] වාසියක් වන්නේ කුමක් ද?

(1) තරඟකාරී තත්ත්වයන් ශක්තිමත් කිරීම. (2) ඵලදායිතාවය ඉහළ නැංවීම.

(3) සේවකයින්ගේ චිත්ත ධෛර්ය වැඩි දියුණු කිරීම. (4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.6** ………… *(සංකල්පනාත්මක / තාක්ෂණික)* කුසලතා යනු නිශ්චිත කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය හැකියාවන් සහ දැනුම වේ.

**1.7** හෙන්රි ෆෙයෝල්ට (Henry Fayol) අනුව, ………… *(මධ්‍යගතකරණය / ධූරාවලිය)* යනු මූලික කළමනාකරණ මූලධර්මයකි.

**1.8** ………… *(අවශ්‍යතා ධූරාවලි න්‍යාය / ද්විත්ව සාධක න්‍යාය)* අනුව, සේවකයින්ගේ කායික අවශ්‍යතාවලින් ආරම්භ වී ආත්ම පරිපූර්ණ අවශ්‍යතා සාක්ෂාත් කිරීම දක්වා වූ මානව අවශ්‍යතා මාලාවක් සපුරාලීමට සේවකයින් අභිප්‍රේරණය කරනු ලබයි.

**1.9** ව්‍යාජ වෙළෙඳ ප්‍රචාරණය වැළැක්වීම සහ තරඟකරුවන් පිළිබඳ නොමඟ යවන තොරතුරු වැළැක්වීම ………… *(සදාචාර සම්පන්න / මූල්‍ය)* අලෙවිකරණයේ පැතිකඩයන් වේ.

**1.10** ………… *[සැලසුම් කළ (planned) / පියවර (step)]* වෙනසකදී, සැලසුම් ගොඩනගනු ලබන්නේ පරිසර විශ්ලේෂණය කර, සංවිධානය ස්ථාවර සහ පුරෝකතනය කළ හැකි පරිසරයක් තුළ ක්‍රියාත්මක වන බව උපකල්පනය කරමිනි. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** සාර්ථක සන්නම්නාමයක් සඳහා අවශ්‍යතාවයන් දෙකක්(02) සඳහන් කරන්න.

**1.12** නිලතන්ත්‍රවාදී කළමනාකරණ න්‍යායේ (Bureaucratic Management Theory) ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** මානව සම්පත් කළමනාකරණයේ ඇති පුහුණු කිරීමේ පොදු ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** "අලෙවි කළමනාකරණය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.15** "මානව සම්පත් කළමනාකරණයේ ද්විත්ව වගකීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත Tech Solutions (පෞද්ගලික) සමාගම,** යනු තොරතුරු තාක්ෂණ සේවා සපයන්නෙකු වන අතර, සෞඛ්‍ය සේවා කර්මාන්තය සඳහා ජංගම යෙදුම් (mobile applications) සංවර්ධනය කිරීම දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කරයි. කළමනාකරණ කණ්ඩායම විසින් යොදා ගතයුතු තාක්ෂණයේ වර්ගය සහ වෙන් කළ යුතු සම්පත් සම්බන්ධයෙන් තීරණ කිහිපයක් ගත යුතුව ඇත. මෙම තීරණ සඳහා, තාර්කික තීරණ ගැනීමේ ප්‍රවේශයක් භාවිත කරමින් විකල්ප පිළිබඳ පරීක්ෂාකාරීව ඇගයීම අවශ්‍ය වේ. සමාගමේ වර්ධනයත් සමඟ පැහැදිලි අරමුණු පිහිටුවීම සහ අනාගත අවස්ථා සමඟ සම්පත් පෙළගැස්වීමට සඵලදායීව සැලසුම් කිරීමේ වැදගත්කම කළමනාකරුවන් අවධාරණය කරති.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ (Rational Decision-Making Process) පියවරයන් (steps) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත Tech Solutions (පෞද්ගලික) සමාගමේ** තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී, සැලසුම්කරණය (planning) උපකාරීවන ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) සැලසුම්කරණයේ මූලධර්ම හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

දිගු වෙලාවක් වැඩ කිරීම සහ දැඩි කාල ඉලක්ක (deadlines) හේතුවෙන් සේවක චිත්ත ධෛර්ය පහත වැටෙන බව **සීමාසහිත BrightTech සමාගමේ** මානව සම්පත් කළමනාකරුට දක්නට ලැබුණි. සේවක කණ්ඩායම අභිප්‍රේරණය කිරීම සඳහා ඔහු විසින් නම්‍යශීලී කාල සටහන්, අගය කිරීමේ වැඩ සටහන් සහ කණ්ඩායම් ගොඩ නැගීම (team-building) වැනි ක්‍රියාකාරකම් හඳුන්වාදෙන ලදී. කෙසේවුවද, වේගවත් තාක්ෂණික වෙනස්වීම්, තරඟකාරීත්වය සහ පාරිභෝගික බලාපොරොත්තු ඉහළ යාම වැනි අභියෝගයන්ට ඔහු මුහුණ දුන්නේය. තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා සමාගම සමාජ මාධ්‍ය හරහා සිදු කරන අලෙවිකරණ උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කළ අතර, ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට බෙදාහැරීමේ මාර්ග පුළුල් කිරීමට සමාගම සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත BrightTech සමාගම** ට අභිප්‍රේරණය වැදගත් වීමට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත BrightTech සමාගම** ට තම තරඟකාරී ස්ථානය (competitive position) නැවත ලබාගැනීම සඳහා ඩිජිටල් අලෙවිකරණය භාවිත කළ හැකි ආකාර දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**සීමාසහිත SilverLine සමාගමේ** ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් සමාගම තුළ භූමිකාවන් (roles), වාර්තාකරණ පිළිවෙළ (reporting lines) සහ සන්නිවේදන මාධ්‍ය පැහැදිලිව නිර්වචනය කිරීමට නව සංවිධානමය ව්‍යුහයක් හඳුන්වාදෙන ලදී. මෙමඟින් දෙපාර්තමේන්තු අතර ඉතා හොඳ සම්බන්ධීකරණයක් සඳහා පහසුකම් සලසන ලදී. මෙහෙයුම් කළමනාකරු විසින් සැලසුම්කරණය, සංවිධානකරණය සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන ලදී. ව්‍යාපාරය එහි සාර්ථකත්වය කරා යොමු කිරීමේදී, මෙහෙයුම් කළමනාකරණය තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හොඳ සංවිධානමය ව්‍යුහයකින්, **සීමාසහිත SilverLine සමාගම** ට ලැබෙන ප්‍රතිලාභ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත SilverLine සමාගමේ** සාර්ථකත්වය සඳහා, මෙහෙයුම් කළමනාකරණය වැදගත්වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත SilverLine සමාගමට** ගුටකදාම / බ්ලොක්චේන් (Blockchain) භාවිත කිරීමෙන් ලැබෙන වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**නෝවා ටෙක්ස්ටයිල්ස්** හි මානව සම්පත් කළමනාකරණ කණ්ඩායම විසින් සේවකයින් ආකර්ශනය, පුහුණුව සහ කාර්යසාධන ඇගයීම් හසුරුවනු ලබන අතර, සේවක කුසලතා සමාගමේ අරමුණු සමඟ පෙළගස්වනු ලබයි. කෙසේවුවද, කළමනාකාරිත්වය විසින් නව ඩිජිටල් පද්ධති හඳුන්වාදීමත් සමඟ සමහර සේවකයින් මෙම වෙනසට ප්‍රතිරෝධය දැක්විය. මෙම ප්‍රතිරෝධය අවම කිරීම සඳහා විවිධ ක්‍රම හඳුන්වාදීමට කළමනාකාරිත්වය සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "රැකියා විස්තරයක්" (a Job Description) සහ "රැකියා පිරිවිතරයක්" (a Job Specification) අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) **නෝවා ටෙක්ස්ටයිල්ස්** ආයතනයට සඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **නෝවා ටෙක්ස්ටයිල්ස්** හි සේවකයින් වෙනස්වීමට ප්‍රතිරෝධය දැක්වීමට හේතු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත Zenith සමාගමේ** ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් ආයෝජන සහ නිෂ්පාදිත සැලසුම් පිළිබඳ තීරණ මෙහෙයවමින් ව්‍යාපාරය ජාත්‍යන්තර වෙළෙඳපොළවල් දක්වා ව්‍යාප්ත කිරීමට දිගු කාලීන උපාය මාර්ග ගොඩනගන ලදී. නිෂ්පාදන කළමනාකරු විසින් කාල සටහන් සැලසුම් කිරීම, සම්පත් වෙන් කිරීම සහ කාල ඉලක්කයන් (deadlines) සපුරාලීම කෙරෙහි අවධානය යොමුකළ අතර, **සීමාසහිත Zenith සමාගමේ** ව්‍යාපෘති භාර නායකයා දැක්මක් සහිතව සේවකයින් පොළඹවන ලද අතර, නවෝත්පාදන සඳහා දිරිගැන්වීම සිදුකරන ලදී. ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී, කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ වැරදි නිවැරදි කිරීම වැනි දැඩි පාලන ක්‍රියාමාර්ග යොදාගන්නා ලදී. පාලනයන් ඉතා දැඩි බව දැනෙන විට, කළමනාකරණයට චර්යාත්මක බලපෑම්වලටද මුහුණ පෑමට සිදුවිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධාන විසින් භාවිත කරනු ලබන විස්තීර්ණ උපායමාර්ග (intensive strategies) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) "පරිවර්තනීය නායකත්වය" (Transformational Leadership) සහ "ගනුදෙනු නායකත්වය"` (Transactional Leadership) අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) **සීමාසහිත Zenith සමාගම** විසින් පාලනයේදී සලකා බැලිය යුතු සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

ගෝලීය වසංගතයේ ඇඩි බලපෑමත් සමඟ වසර ගණනාවක් පුරා රට තුළ පැවති ආර්ථික සහ දේශපාලනික අස්ථාවරත්වයෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් සිටී. සුප්‍රසිද්ධ හෝටල් ජාලයක් වන **සීමාසහිත Moon Hotels පොදු සමාගම** සංචාරකයින් පැමිණීමේ උච්ඡාවචනයන්, ඉහළ තරඟකාරීත්වය සහ ඉහළ මෙහෙයුම් පිරිවැයවලට මුහුණ දී තිබේ. මෙම අභියෝග ජය ගැනීමට සහ නව අවස්ථාවන් ග්‍රහණය කර ගැනීම සඳහා සමාගම එහි ව්‍යාපාරික පරිචයන් (business practices) නැවත ඇගයීම ආරම්භ කර තිබේ.

අවිනිශ්චිතතාවය තුළ සේවකයින් මෙහෙයවමින් කණ්ඩායම් අභිප්‍රේරණය කිරීම සහ සැමොම ආයතනයේ පොදු අරමුණු කරා ළඟා වීමට වැඩකරන බව සහතික කිරීමට නායකත්ව කුසලතාවලින් යුත් ශක්තිමත් නායකත්වයක් **සීමාසහිත Moon Hotels පොදු සමාගම** ට අවශ්‍ය වේ. ඒ සමගම, අලෙවිකරණ අංශය මගින් සන්නාම දැනුවත්භාවය ගොඩනංවමින්, වට්ටම් පිළිබඳ සන්නිවේදනය කිරීමෙන් සහ ගනුදෙනුකරුවන්ගේ සම්බන්ධතා රැකගෙන යාම මගින් දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් යන දෙපාර්ශවයම ආකර්ෂණය කර ගැනීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

කෙසේවෙතත්, මෙහෙයුම් පුළුල් කිරීමේ උනන්දුව මත, සමාගම විසින් මෑතකදී දුර්වල බඳවාගැනීමේ තීරණ කිහිපයක් ගෙන ඇති අතර, සේවකයින්ගේ කුසලතා සහ රැකියා අවශ්‍යතා අතර, නොගැලපීමට, එය හේතු වී ඇත. මෙමගින් ව්‍යාපාරයේ මෙහෙයුම්වලට සෘණාත්මක ප්‍රතිවිපාක කිහිපයක් ඇති වී තිබේ. මෙම ඉගෙනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මානව සම්පත් දෙපාර්තමේන්තුව නිසි තෝරාගැනීමේ පිළිවෙත්වල වැදගත්කම දැනටමත් හඳුනාගෙන ඇත.

ආයතනයේ දිගු කාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා, කළමනාකාරීත්වය විසින් උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් සිටී. ඉක්මනින් වෙනස් වන පරිසරයක් තුළ තරඟකාරීව සිටීම සඳහා හොඳින් සැලසුම් කරන ලද උපායමාර්ගයක් පමණක් **සීමාසහිත Moon Hotels පොදු සමාගමට** උපකාරී වන බව, ඔවුන් අවබෝධ කරගෙන සිටී.

**ඔබ විසින් කළ යුතු දැ:**

(a) නූතන යුගයේ නායකයෙකුට අවශ්‍ය විශිෂ්ඨ නායකත්ව සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත Moon Hotels පොදු සමාගමේ** නායකයෙකු විසින් ඉටුකළ යුතු වැදගත් කාර්යයන් / භූමිකා තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) **සීමාසහිත Moon Hotels පොදු සමාගමට** සඵලදායී අලෙවිකරණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(d) **සීමාසහිත Moon Hotels පොදු සමාගම** සම්බන්ධයෙන්, වැරදි සේවකයෙකු තෝරාගැනීමේ තීරණයක ප්‍රතිවිපාක හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(e) **සීමාසහිත Moon Hotels පොදු සමාගමට** එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් උපකාර වන ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |